පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

## CENTER FOR DISTANCE & CONTINUING EDUCATION

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය අගෝස්තු 2016**

**GENERAL DEGREE EXAMINATION (EXTERNAL)**

**AUGUST 2016**

**ඉතිහාසය I ( HG I )**

**ක්‍රි.ව. 320 දක්වා උතුරු ඉන්දියාවේ ඉතිහාසය**

කාලය පැය 03යි.

යටත් පිරිසෙයින් **එක්** කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** (4 ) පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි දළ සිතියම් මගින් ඔබේ පිළිතුර පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දොළස (12) කි.

---

### පළමු කොට

01. හරප්පා ශිෂ්ටාචාරයේ ප්‍රධාන නාගරික ලක්ෂණ පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

02. හරප්පා සභ්‍යත්වය බිඳවැටීමට තුඩුදුන් සාධක පරීක්ෂා කරන්න.

03. පුරාතන ඉන්දියාවේ සමාජ ඉතිහාසය හැදෑරීමෙහිලා වෛදික සාහිත්‍යට හිමිවන වැදගත්කම සාකච්ඡා කරන්න.

04. ක්‍රිස්තු පූර්ව සවැනි සියවසේ උතුරු ඉන්දියාවේ පැවැති දේශපාලන තත්ත්වය සමාලෝචනය කරන්න.

### දෙවෙනි කොටස

05. අධිරාජ්‍යය බලයක් ලෙසින් මගධයේ නැගීමට තුඩුදුන් සාධක විභාග කරන්න.

06. රාජ්‍යය පිළිබඳ කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ විස්තර කෙරෙන දේශපාලන න්‍යායයන් සාකච්ඡා කරන්න.

07. මෞර්ය සමයේ බාහිර ලෝකය සමඟ පැවැත් වූ වාණිජ හා සංස්කෘතික සබඳතා පිළිබඳ විවේචනාත්මකව විග්‍රහයක් කරන්න.

08. "අශෝකගේ ධර්ම ප්‍රතිපත්තිය වූ කලී හුදෙක් අධිරාජ්‍යය මත රාජකීය අධිකාරිය තහවුරු කරනු සඳහා යොදා ගන්නා ලද එක් උපක්‍රමයක් විය." පැහැදිලි කරන්න.

## තෙවන කොටස

09. සමකාලීන අවධියේ ඉතිහාසය හැදෑරීම සඳහා ඉන්දු-ග්‍රීක කාසිවලට හිමිවන වැදගත්කම ප්‍රමාණ කරන්න.

10. ඉන්දියාව තුළ කුෂාණවරුන්ගේ බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා සාකච්ඡා කරන්න.

11. රුද්‍රදාමන්ගේ ජුනාගාර්ඩ් හා ඛාරවේලගේ හත්ථිගුම්ඵා අභිලේඛනවල ඓතිහාසික වැදගත්කම පරීක්ෂා කරන්න.

12. ශක-ක්ෂත්‍රප යුගයේ දේශපාලන කටයුතුවල ප්‍රධාන ලක්ෂණ සැකෙවින් ගෙනහැර දක්වන්න.